සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම

වාර්ෂික වාර්තාව
2018

27, මෙල්බෝර්න් ඇවනිව්, කොළඹ 4, ශ්‍රී ලංකාව
දුරකථන: +94 11 523 2583 ෆැක්ස්: +94 11 250 0674
ඊ මේල් : infosugarsrilanka@gmail.com



මිහිරි සඵලත්වය

කරා ගමනාරම්භයක්

සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගම
අපගේ ගොවීන් සංවර්ධනය කිරීම අප ජාතියේ ආඩම්බරයයි

අන්තර්ගතය

අපගේ දර්ශනය, දැක්ම, අරමුණු, ක්‍රමෝපායන්, පර්යේෂණ සහ සංවර්ධනය සංස්ථානික සමාජ වගකීම්	4
මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුවීම්	6
සභාපතිතුමාගේ ප්‍රකාශය	8 -9
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ ප්‍රකාශය	10
අවදානම් කළමනාකරණය	11
අපගේ සංස්කෘතිය සහ සාරධර්ම	13
අභ්‍යන්තර විගණකගේ වාර්තාව	14
අධ්‍යක්ෂ මණ්ඩලය	16 - 18
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ ආයතනික ව්‍යුහය	20 - 24
ස්වාධීන විගණකගේ වාර්තාව	25 - 34
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	35
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	36
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය	37
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	38
මූල්‍ය ප්‍රකාශන වලට සටහන්	39 - 59
බණ්ඩ වශයෙන් මූල්‍ය තොරතුරු- සෙවනගල සහ පැල්වත්ත	60 - 67
ප්‍රස්ථාරික බණ්ඩ තොරතුරු සැසඳීම - සෙවනගල සහ පැල්වත්ත	68
ප්‍රගති වාර්තාව	69 - 72
සංස්ථානික තොරතුරු	73

අපගේ දර්ශනය

ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණුකිරීමෙන් ජාතික සංවර්ධනයට දායක වීම තුලින් සීනි මත පදනම්වූ ගොවිතැන් සහ කර්මාන්ත හරහා ගොවීන්ගේ ප්‍රජා ආර්ථික තත්වය උසස් කිරීම

අපගේ දැක්ම

සීනි සැපයුමින් ස්වයංපෝෂිත වීම

අපගේ අරමුණු

මෙහෙවර 333 - කෙටි කාලීන - (2021 තෙක් වසර 3 කට)

1) මෙට්‍රික් ටොන් 50,000 ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
2) ගොවි පවුල් 15,000 කට උපකාර කිරීම.
3) වක්‍ර රැකියා අවස්ථා 50,000ක් සැපයීම.
4) ගොවි පවුලක දළ ආදායම මාසිකව රු.35,000 දක්වා වැඩි කිරීම.
5) ජාතික සීනි අවශ්‍යතාවයට 15%ක දායක වීම.
6) රුපියල් බිලියන 1 ක ලාභයක් සාක්ෂාත් කරගැනීම.
7) විදේශ විනිමය වශයෙන් රුපියල් බිලියන 15 ක් ඉතිරි කිරීම.
8) සමගාමිව මෙගා වොට් 45 ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

666 පරමාර්ථය - දිගු කාලීන - (2023 තෙක් වසර 5 කට)

1) මෙට්‍රික් ටොන් 75,000 ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
2) ගොවිතැනෙහි යෙදෙන පවුල් 20,000 ක් නඩත්තු කිරීම.
3) වක්‍ර රැකියා අවස්ථා 60,000 ක් සැපයීම.
4) කෘෂිකාර්මික පවුලක දළ ආදායම මාසිකව රු.35,000 දක්වා වැඩි කිරීම.
5) දේශීය සීනි අවශ්‍යතාවයෙන් 40% ක් නිෂ්පාදනය කිරීම.
6) රුපියල් බිලියන 2 ක ශුද්ධ ලාභයක් සාක්ෂාත් කරගැනීම.
7) විදේශ විනිමය වශයෙන් රුපියල් බිලියන 20 ක් ඉතිරි කිරීම.
8) සමගාමිව මෙගා වොට් 60 ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

උපාය මාර්ග

1) වගාකරන්නා මත පදනම්වූ අපගේ වගා මාදිලිය උසස් ප්‍රතිඵල ලැබෙන ව්‍යාපාර හවුල්කරුවා සඳහාය.
2) වැඩි ඵලදාවක් ලබාදෙන ප්‍රභේදයන්, කාර්යක්ෂම ව්‍යාප්ත සේවාවක් සහිත වඩා හොඳ කෘෂිකාර්මික පරිචයන් භාවිතා කරමින් ගොවීන්ට වැඩි ප්‍රතිලාභ ලබාදීම තහවුරු කිරීම.
3) ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ඵලදායිතාවය සඳහා දිරිගැන්වීම් ලබා දීමෙන් ගොවීන් අභිප්‍රේරණය කිරීම
4) ඵලදායිතාව හා කාර්යසාධනය පදනම් කරගත් දිරිගැන්වීම් මඟින් කාර්යමණ්ඩලය අභිප්‍රේරණය කිරීම.

පර්යේෂණ සහ සංවර්ධනය

උක් පර්යේෂණ ආයතනය සමග උක් වගාව සහ සීනි ඵලදායීතාවය වැඩි කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකරමින් පවතී.

සංස්ථානික ප්‍රජා වගකීම්

වගාවේ නියුතු ගොවීන්ගේ ආදායම් අගයන් වැඩිකර, අපගේ මෙහෙයුම් දියත් කරන ප්‍රජාව සහ පරිසරය තුලට අගයන් එකතු කර යුතු බව අපගේ විශ්වාසයයි.




මිහිරි සවලත්වය
සඳහා සාරවත් බවින් පොහොසත් වීම

සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම

මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුවීම් - 2018

(අගයන් රුපියල් මිලියන වලින් දැක්වේ)	2018	2017	2016
මූල්‍යමය ඉස්මතු කිරීම්			
පිරිවැටුම	6,242.95	7,616.94	7,728.89
විකුණුම් පිරිවැය	(5,025.82)	(6,102.70)	(5,547.83)
දළ ලාභය (අලාභය)	1,217.13	1,514.24	2,181.06
බදු වලට පෙර ශුද්ධ ලාභය (පාඩුව)	144.34	402.70	1,006.29

මෙහෙයුම් කාර්‍යසාධනය	2018	2017	2016
ඉඩම් වගාව			
වගාකල හැකි බිම් ප්‍රදේශය (හෙක්ටෙයාර්)	13,831	14,265	17,499
වගාකල බිම් ප්‍රදේශය (හෙක්ටෙයාර්)	12,175	12,622	13,022
වගාකල බිම් ප්‍රදේශයේ ප්‍රතිශතය	88%	88%	74%

අස්වනු වැඩසටහන	2018	2017	2016
ලබාගත් උක් අස්වැන්න (මෙට්‍රික් ටොන්)	611,519	589,139	651,094
පසුගිය වසරට සාපේක්ෂව වැඩිවීම / අඩුවීම	4%	-9.52%	16%
සීනි ලබාගැනීමේ අනුපාතය	6.9 %	7.27%	7.90%

සීනි නිෂ්පාදනය	2018	2017	2016
නිෂ්පාදනය - මෙට්‍රික් ටොන්	42,770	42,822	51,422
ඒක පුද්ගල නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	9.05	9	10.49

මානව සම්පත්	2018	2017	2016
ස්ථිර	1,295	1,351	1,429
කොන්ත්‍රාත් පදනම	1,277	1,232	1,176
අනියම්	2,065	2,131	1,731
වාරික හෙවත් කාලීන		-	527
පුහුණුවන්නන්	89	111	37
මුළු ගණන	4,726	4,825	4,900

මිහිරි සඵලත්වය

අහස සමග ගැටෙන විටක



සභාපතිවරයාගේ ප්‍රකාශය



2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ 2018 වාර්ෂික වාර්තාව, අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම සතුටින් ඉදිරිපත් කරමි. සමාලෝචිත වර්ෂයේදී කාර්යසාධනයට බලපෑ සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාත්මක සාධක රාශියක අභියෝගවලට මුහුණදීමට සිදුවිය. උක්වගා ඵලදාව හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 54.23 සිට මෙට්‍රික් ටොන් 59.64 දක්වා වැඩි වූ නමුත් සීනි ආපසු උකහාගැනීමේ ප්‍රතිශතය 7.27% සිට 6.99% දක්වා නිෂ්පාදන පරිමාවට අහිතකර බලපෑමක් සිදු කරමින් අඩු විය.

ආර්ථික පරිසරය

ශ්‍රී ලංකාවේ මූර්ත ආර්ථික වර්ධනය 2017 වර්ෂයේ 3.1% හා සැසඳීමේදී 2018 වර්ෂයේදී 3.2% විය. පසුගිය වර්ෂයේ මුහුණදුන් අහිතකර කාලගුණික තත්වයෙන් මිදීමක් පෙන්නුම් කරමින් කෘෂිකාර්මික කටයුතු සියයට 4.8 කින් 2018 වර්ෂය තුල වර්ධනය විය. මේ අතර, කාර්මික කටයුතු වල වර්ධනය පසුගිය වර්ෂයේ සියයට 4.1 සිට සියයට 0.9 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. කාර්මික සම්බන්ද කටයුතු වල මන්දගාමිත්වයට විශේෂයෙන් ඉදිකිරීම්, පතල් හා කැනීම් කටයුතු වල සිදු වූ සංකෝචනය බලපාන ලදී. පසුගිය වර්ෂයේ සිදු වූ සියයට 3.6 ක වර්ධනය හා සැසඳීමේදී සේවා අංශය 2018 වර්ෂයේදී සියයට 4.7 කින් වර්ධනය විය. සේවා අංශය තුල, මූල්‍ය සේවා ආර්ථික වර්ධනයට ප්‍රධාන දායකත්වය සැපයු අතර තොග සහ සිල්ලර කටයුතු අනෙකුත් ප්‍රධාන දායකත්වය සැපයීය. සීනි සහ රසකැවිලි ආනයන වියදම 2018 වර්ෂයේදී සියයට 3.2 කින් පහත වැටුණි.

දළ කර්මාන්ත විශ්ලේෂණය

ශ්‍රී ලංකා මහබැංකු වාර්තාවට අනුව 2017 වර්ෂයේ සීනි නිෂ්පාදනයේ දක්නට ලැබුණු මන්දගාමිත්වය 2018 වර්ෂය පුරාද පැවතිනි. සලකා බලන කාලය තුල මුළු දේශීය සීනි නිෂ්පාදනය 2017 වර්ෂයේදී වාර්තා කරන ලද සියයට 9.3 ක පහත වැටීම හා සැසඳීමේදී මෙ. ටො. 51,265 දක්වා සියයට 7.7 ක අඩු වීමක් වාර්තා කරන ලදී. ඒ අනුව 2017 හි වාර්තා කරන ලද මෙ. ටො. 746,607 හා සැසඳීමේදී 2018 දී උක් දඩු මෙ. ටො. 720,259 ක් අබරන ලදී. සීනි උකහා ගැනීමේ අනුපාතය 2017 සියයට 7.4 සිට 2018 සියයට 7.1 දක්වා අඩු විය. මේ අතර අඩු දේශීය නිෂ්පාදනය සහ ජාත්‍යන්තර වෙළඳපොළ තුල පවති පහල මිල ගණන් හේතුවෙන් සීනි ආනයනය 2017 මෙ.ටො. 497,952 සිට 2018 මෙ.ටො. 644,675 දක්වා සියයට 29.5 කින් වර්ධනය විය. සමස්තයක් ලෙස දේශීය සීනි නිෂ්පාදකයින්ට 2017 සියයට දහයට සාපේක්ෂව 2018 රටේ සීනි ඉල්ලුමෙන් සියයට නමයක් සැපයීමට හැකි වූ අතර ඉතිරි දේශීය ඉල්ලුම ආනයන මගින් සපුරා ගැනිණි

සමාගමේ කාර්‍යසාධනය

සෙවනගල කර්මාන්ත ශාලාව පසුගිය වර්ෂයේ වාර්තා කල මෙ. ටො. 15,179 ට සාපේක්ෂව 2018 වර්ෂයේ සීනි මෙ. ටො. 14,709 ක් නිෂ්පාදනය කරන ලදී. පැල්වත්ත කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය සියයට 1.5 කින් මෙ. ටො. 28,061 දක්වා වැඩි විය. සමස්ථ දේශීය සීනි නිෂ්පාදනය සඳහා ලංකා සීනි සමාගමේ ඇස්තමේන්තු ගත දායකත්වය සියයට 83 ක් විය. ස්ප්‍රීතු නිෂ්පාදනයද 2017 වර්ෂයේ ලීටර් 7,045,223 සිට 2018 වර්ෂයේ ලීටර් 9,787,942 දක්වා වැඩි විය.

සුභ සාධනය

සමාගම වර්ෂය තුළදී සැලකිය යුතු මුදලක් සුභසාධනය වෙනුවෙන් වැයකරන ලදී. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා වෙනම නඩත්තු කාර්ය මණ්ඩලයක් වෙන්කරන ලදී. සමාගම විසින් සේවක පවුල් වල දරුවන් සඳහා පාසල් ප්‍රවාහන සේවාවක් සපයා ඇත. පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සමාගම විසින් පවත්වාගෙන යන ලදී.

ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වේගයෙන් ඉදිරියට යන අතර එහි සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට හැකිවේ යැයි අපේක්ෂා කෙරේ. රජයේ ප්‍රතිපත්ති හා පහළ පොලී අනුපාතයන් අපගේ නව ආයෝජන විකල්පවලට ආරාධනා කරයි. අපගේ නිෂ්පාදිතයට නිෂ්චිත වෙළඳපොලක් ඇත. කළමනාකාරීත්ව අඛණ්ඩව උක් වගා බිම වැඩිකිරීමට ඉලක්ක කරයි. දැනට සිටින ගොවීන් අභිප්‍රේරණය කිරීමෙන් හා කර්මාන්තයට නව ගොවීන් ගෙන ඒමෙන් ප්‍රතිඵල අත්කර ගැනීමට බලාපොරොත්තු වෙමි.

නව ඉඩම් අත්පත්කරගැනීම හා අප වගාවේ ඵලදායිතාව වර්ධනය කිරීමද වැදගත් වේ. ප්‍රධාන නිෂ්පාදනයට අමතරව මෙහෙයුම්වලින් උපරිම ඵල නෙලාගැනීමට අතුරු නිෂ්පාදන සංවර්ධනය කිරීම ඉලක්ක කළෙමු.

ස්තුතියි

අධ්‍යක්ෂ මණ්ඩලයට කළමනාකාරීත්වයට සහ සමාගමේ කාර්ය මණ්ඩලයට 2018 සහ ඊට පෙර වර්ෂවලදී ලබාදුන් උත්සහාය හා වටිනා දායකත්වය සම්බන්ධයෙන් මාගේ ගෞරව පූර්ව ස්තුතිය සටහන් කර තැබීමට කැමැත්තෙමි.

තවද පසුගිය කාලය පුරාම සමාගම සමඟ සිටි උක් වගාකරුවන්, ගනුදෙනුකරුවන්, සීනි තොග වෙළඳුන්, බැංකු සහ රාජ්‍ය ආයතන වලටද මාගේ ස්තුතිය පුද කරමි.

නවීන් අධිකාරම
සභාපති

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශය



හිතවත් සියලුම ඇල්මැති පාර්ශවකරුවනි,

ව්‍යාපාර පරිසරය

මූල්‍ය තත්ත්වයට ධනාත්මක බලපෑමක් ඇති කරමින් 2018 වර්ෂය මිශ්‍ර ප්‍රතිපල ජනනය කරන ලදී. වර්ෂය තුල පැවති අහිතකර කාලගුණික තත්ත්ව මැද සීනි නිෂ්පාදනය මෙ. ටො. 52 කින් අඩු වූ අතර ස්ප්‍රිතු නිෂ්පාදනය ලීටර් 2,742,719 කින් වැඩි විය. වසර තුළදී සීනි කිලෝ ග්‍රෑම් එකකට රු.97 ක සහ, ස්ප්‍රිතු ලීටරයකට රු.360 ක සාමාන්‍ය විකුණුම් මිලක් පවත්වාගෙන යාමට සමාගමට හැකි විය. සලකා බලන මූල්‍ය වර්ෂයේ සමාගම පසුගිය වර්ෂයේ වාර්තා කරන ලද රු. මිලියන 7,616 ට සාපේක්ෂව රු. මිලියන 6,242 ක අදායමක් වාර්තා කරන ලදී. සමාගම 2018 වර්ෂය සඳහා රු. මිලියන 144 ක බදු පෙර ලාභයක් වාර්තා කල අතර එය 2017 වර්ෂයේ වාර්තා කල බදු පෙර ලාභය වන රු. මිලියන 402 හා සැසඳීමේදී තියුණු පසුබැමකි. වර්ෂය තුල විකිණුම් පිරිවැය රු. මිලියන 1,077 කින් අඩු විය. පරිපාලන වියදම් රු. මිලියන 2 කින් වැඩි විය. මූල්‍ය අදායම රු. මිලියන 51 කින් වැඩි වූ අතර මූල්‍ය වියදම රු. මිලියන 32 කින් වැඩි විය.

තාක්ෂණික (Technical)

මුදල් ප්‍රවාහ නිකුතුන් විසඳීම ස්ථිරව තහවුරු කිරීමට අතිවිශාල වැඩ කොටසක් තාක්ෂණික කණ්ඩායම සඳහා පිළියෙල කරන ලදී. මෙයට විධිමත් සහ විනිවිදභාවයෙන් යුතු විකුණුම් ක්‍රම විශ්ලේෂණය, සියලු කාර්මික කරුණු තක්සේරු කිරීම 2016 වර්ෂය ආරම්භ වීමට පෙර 4% ට වැඩිව තිබූ කර්මාන්තශාලා පාඩුව නිශ්චිත ප්‍රමාණය කරා ගමන්කිරීම, අහිතකර කරුණු හඳුනා ගැනීම ආදියද ඇතුළත් වේ. ඉස්කාරයේ ගුණාත්මක තත්වයට අදාළ ප්‍රශ්න නිවැරදි කිරීමටද මෙම කාර්යයන් දීර්ඝ කරන ලදී. කොටසක් යාන්ත්‍රිකරණ ලද මූලික උක්දඩු අස්වැනු නෙලන්නන් මඟින් අස්වැනු නෙලීම් ප්‍රමාදයන්ද අමතනු ලැබීය. එයින් අස්වැනු නෙලීම කඩිනම් කෙරේ. එලදාව පරණ වීම අවම කිරීමට හැකිවන පරිදි බර ඔසවන ඇණියක් එකතු කරන ලදී. කර්මාන්තශාලා, ඒවායේ ධාරිතාව වැඩිකිරීම සඳහා වැඩ මුර ක්‍රමයට හරවන ලදී. එමඟින්, වාරිමාර්ග සැලසුම් හා අතිරේක වගා සැලසුම් හේතුකොට ගෙන ඇතුළට එන අතිරේක අස්වැන්න භාවිතා කිරීමට හැකිවිය.

මානව සම්පත

සමාගමේ සාර්ථකත්වය පදනම වන්නේ එහි සේවකයින්ය. සමාගමේ සේවකයින් සමාගමේ වටිනාකම් සමඟ හසුරුවනු ලබන අතර ඔවුන්ගේ ආරක්ෂාව ඉලක්ක කෙරේ. අපගේ සේවකයින්, ගනුදෙනුකරුවන් විශිෂ්ඨත්වය, අවංකභාවය සහ අපගේ ප්‍රජා පුහුණුව හා සංවර්ධනය ඉතාමත් වටිනා සම්පත් දියුණු කිරීමට හා රඳවා ගැනීමේ ප්‍රධාන මෙවලම් වේ. පුද්ගල යන්නට අපගේ ගොවීන්ද ඇතුලත් වේ. එබැවින්, විධිමත් පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂවලදී පවත්වාගෙන යාම කළමනාකාරීත්වයේ පරම ප්‍රමුඛත්වය වී ඇත.

සියලුම සේවකයන්ට හා කළමනාකාරීත්වයට ඔවුන්ගේ කැපවීම හා මහන්සි වී වැඩකිරීම සම්බන්ධයෙන් ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. සමස්ත උත්සාහය බෙහෙවින් අගය කරන අතර සියලුම ඇල්මැති පාර්ශවකරුවන්ට (Stakeholders) වාසි සැලසෙන අයුරු එක් එක් අවස්ථාවන් ප්‍රශස්ත කිරීමට අපි දිගින් දිගටම කටයුතු කරමු.

මොහොමඩ් ෂෙරිෆ්ඩීන් මොහොමඩ් ෆවුසර්
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

අවදානම් කළමනාකරණය

අවදානම් වර්ගීකරණය	විස්තරය	ක්‍රියාන්විතයේ සැලසුම
මෙහෙයුම් අවදානම	උක් වගාව සඳහා ඉඩම් වෙන්කිරීම.	◆ උක් දඩුමිල රු.4500/- සිට රු.5000/- දක්වා වැඩිකිරීම. ◆ අස්වැන්න සඳහා අත්තිකාරම් සහ ණය පදනම යටතේ අනෙකුත් ද්‍රව්‍ය පිරිනැමීම. ◆ රජය හඳුන්වා දුන් පොහොර සහනාධාරය නිසා උක්ගොවීන්ටද වාසි අත්විය.
ණය අවදානම	ගොවීන්ට දෙන ලද යෙදවුම් හේතුකොට ගෙන බොල් ණය පැන නැඟීම.	ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයට වැඩි වගකීම් පැවරීම.
උද්ධමන අවදානම	වැඩි වූ යෙදවුම් පිරිවැය හා පොදුකාර්ය පිරිවැය හේතුකොට ගෙන ලාභදායීත්වයට බලපෑමේ අවකාශය	ඵලදායීතාව වැඩිකිරීම හා නිෂ්පාදන පිරිවැය අඩුකිරීම ඉලක්ක කිරීම.
වෙළඳපොල අවදානම	දේශීය සීනි සපයන්නන් අඩු මිලට සීනි ආනයනය කිරීම.	ඒකකයක පොදුකාර්ය පිරිවැය අඩුකිරීම පිණිස නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම.
පාරිසරික අවදානම	උක් අස්වැන්නට අලි ඇතුන්ගෙන් හා දේශගුණික වෙනස්වීම්වල බලපෑම, ඵලදාව අඩුවීමට හේතුවිය හැක.	සමාගමේ පිරිවැයෙන් අලි ඇතුන්ට එරෙහිව අගල් කැපීම, අලිවැට ඉදිකිරීම හා මිනිස් බාධක සංවර්ධනය කිරීම.



ප්‍රබෝධමත් සිනාව,
මිහිරි සඵලත්වය

අපගේ සංස්කෘතිය සහ සාරධර්ම

අපගේ ගොවියන්

අපේ රජු ගොවියාය. ගොවියා සමාගමේ ඉතාමත් ප්‍රබල වැදගත් ඇල්මැති පාර්ශවකරුවන්ගෙන් කෙනෙකු බව සමාගම විශ්වාස කරයි. සෑම ඉඩමක්ම පාහේ වගා කරන්නේ ගොවීන් නිසා සෙවනගලට අයත් වගා ඉඩම් සීමිත ප්‍රමාණයක් පමණක් තිබීම, සෙවනගලට තීරණාත්මක සාධකයක් වෙයි. හෙක්ටෙයාරයක උක් වගාවකින් මාසයකට ලබාගත හැකි සාමාන්‍ය ආදායම රු.35,000 ක් පමණ වන බව ඇස්තමේන්තු කර තිබුණි. බොහෝ ප්‍රදේශවල උක් වගාවේ නිරත ගොවීන්ගේ ආදායම පහළ මට්ටමක පැවතුණි. එම තත්වය ගොවීන් එම කර්මාන්තයේ රඳවා තබා ගැනීම අධෛර්යමත් කිරීමට හේතු විය. ඒ වෙනුවට ඔවුන් වෙනත් වගාවන්ට මාරු විය. ලංකා සීනි සමාගම මෙම තත්වය ආරම්භයේදීම හඳුනාගත් අතර ඔවුන්ගේ ආදායම වැඩිකිරීමට බොහෝ උත්සාහයන් ගනු ලැබීය. වර්තමානයේදී ගොවියෙකුට උක් මෙට්‍රික් ටොන් එකකට රු.4,500 ක් ගෙවනු ලබන අතර මීට පෙර එම මුදල මෙට්‍රික් ටොන් එකකට රු.4,200 කි. එබැවින්, මේ වනවිට උක් වගා ඉතිහාසයේ උක් මෙට්‍රික් ටොන් එකකට වැඩිම මිලක් ගෙවන ආයතනය බවට ලංකා සීනි සමාගම පත්වී ඇත.

අපගේ ගණුදෙනුකරුවා

අපේ ගනුදෙනුකරුවා අපේ බලාපොරොත්තුවයි. අප ජනගහනයෙන් මිලියන 20 කට අධික සංඛ්‍යාවක් අපගේ ගනුදෙනුකරුවන් වේ. අපගේ මූලික අරමුණ වනුයේ මොවුනට ගුණාත්මක සීනි සාධාරණ මිලකට සැපයීමයි. ශ්‍රී ලාංකිකයකුගේ සාමාන්‍ය වාර්ෂික සීනි පාරිභෝජනය කිලෝග්‍රෑම් 30 - 35 අතර වේ. අපගේ නිෂ්පාදන ධාරිතාව 8% ක වැනි පහත් මට්ටමක පවතින බැවින් ඉතිරි 92% ක ප්‍රමාණය ආනයනය කිරීමට සිදු වේ. වර්ෂයකට ඇ.ඩොමි. 250 කට අධික වියදමක් සීනි ආනයනය කිරීම සඳහා දරනු ලැබේ. මෙය අපගේ ආර්ථිකයට බරපතල සෘණාත්මක බලපෑමකි.

අපගේ සේවකයා

අපගේ සේවකයින් අපේ ධනය වෙති. පක්ෂපාතී, අභිප්‍රේරිත සේවක පිරිසකගෙන් තොරව කිසිදු සංවිධානයකට සාර්ථක වීමේ හැකියාවක් නැත. අප සේවකයින්ගේ කැපවීමේ හා උත්සාහයේ මට්ටම පිළිඹිබු වන්නේ මෙහෙයුම් ප්‍රතිඵලවලිනි. ලංකා සීනි සමාගමේ වැදගත් කේන්ද්‍රස්ථානයක් වනුයේ එහි මානව සම්පතයි. අතීතයේදී සීනි කර්මාන්තයේ යෙදී සිටි සේවකයින්ට ඔවුන්ගේ ජීවන රටාව තුළ රැකියා කොන්දේසි, පහත් මට්ටමේ මාසික ආදායම ප්‍රසාද දීමනා, උසස්වීම් ආදී ගැටලු සහිත අසීරු තත්වයන්ට මුහුණ දීමට සිදුවිය. මේ සම්බන්ධව දැනුවත් වී සමාගම මෙම ගැටලුවලට ඇමතීමට ප්‍රමුඛත්වය දී කටයුතු කළේය.

යහ පාලනය

අපගේ ව්‍යවස්ථාපිත විගණක, විගණකාධිපති දෙපාර්තමේන්තුවයි. බාහිර විගණනයට අමතරව, පැල්වත්ත සහ සෙවනගල යන අංශ දෙකේම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු පිහිටුවා ඇති අතර එය ඍජුවම සභාපතිතුමාට වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව, අබණ්ඩ පදනමක් මත අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනයට ලක්කර ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ පැහැදිලි කිරීම් ලබාගෙන, ඔවුන්ගේ සොයාගැනීම් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.

සීමාවන් (Constraints)

නිරන්තරයෙන් අනාගතය කරා දිශානත වීම සඳහා ප්‍රධාන ගැටලු කීපයක් තවමත් විසඳිය යුතුව ඇත. සමාගමට අයත් නොවන චංචල වත්කම් හේතුකොට ගෙන පැල්වත්ත හා සෙවනගල යන පරිශ්‍ර දෙකම අවහිර වී ඇත. ඒවා ඉවත් කිරීමට හෝ ක්‍රියාවලියට අන්තර්ග්‍රහණය කිරීමට නෛතික කටයුතු අවසන් වනතුරු බලාසිටිමු. ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ඉතා සෙමින් සිදුවන අතර ප්‍රමාණවත් ඉඩම් ප්‍රමාණයක් පවරාගන්නා තුරු අපගේ දිගුකාලීන හා මධ්‍යකාලීන සැලසුම් අත්හිටුවීමට සිදු වී ඇත. මෙය කළමනාකාරීත්වයේ පාලනයෙන් බැහැර කර්තව්‍යයකි.

ශ්‍රී ලංකා රජය විසින් නියම කර ඇති ඉලක්ක සපුරාලීම සඳහා අවශ්‍ය උපායමාර්ග දැනටමත් කළමනාකරණය විසින් සම්පාදනය කොට ඇත. නව ආයෝජනයට අරමුදල් සපයා ගැනීම සමාගමට තවත් ගැටලුවක් වී ඇත. බොහෝ බැංකු සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ඇප වශයෙන් තබාගන්නා නමුත් පැල්වත්ත හා සෙවනගල ඉඩම්වල අයිතිය ලංකා සීනි (පුද්) සමාගමට නැත. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ හා අමාත්‍යාංශයේ සහායෙන් අරමුදල් සපයා ගැනීමේ කාර්යයයේ නිරතව සිටී.

පැල්වත්ත තොරතුරු පද්ධතිය තුල මෙහෙයුම් කටයුතුවල ඓතිහාසික හා වර්තමාන තොරතුරු තැන්පත්ව ඇත. එහෙත් සෙවනගල සේවක තොරතුරු සියල්ලක්ම පෙර කළමනාකාරීත්වය විසින් රැගෙන ගොස් ඇති හෙයින් සේවක පාරිතෝෂික දීමනා, ප්‍රතිපාදන සහ අනෙකුත් සේවකයන්ට සම්බන්ධ කරුණු අත්හිටුවා ඇත. එබැවින්, සෙවනගල සීනි සමාගමේ පෙර කළමනාකරණය විසින් පවත්වාගෙන ගිය පොත්පත් හා ලිපිලේඛන ලබාගැනීමට රජය විසින් පියවර ගත යුතුව ඇත.

විගණන කමිටුවේ වාර්තාව

සමාගමේ විගණන කමිටුවේ සාමාජිකයින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබේ. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටු රැස්වීම්, අවශ්‍යතාවය පරිදි මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ සහභාගීත්වයෙන් රැස්කෙරේ. සභාපති, අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ආරාධනයෙන් එම රැස්වීම්වලට සහභාගී වන අතර රැස්වීම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) විසිනි.

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම්

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් ඇතුළුව සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හා මූල්‍ය වාර්තාකිරීමේ ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් පාලන වගකීම ඉටුකිරීමයි.

තවද, කලින් කල මහා භාණ්ඩාගරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා මාර්ගෝපදේශ ඇතුළුව සමාගමේ අභ්‍යන්තර පාලනය සහ අවදානම්වල කළමනාකරණය ප්‍රමාණවත්ද සහ සමාගම විසින් නෛතික හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කරගැනීම සඳහා ක්‍රියාවලීන් පිළිබඳ වගකීම් ඉටුකිරීමද ඇතුළත් වේ.

මූල්‍ය වර්ෂය තුළ ලත් ප්‍රගතිය

විගණන කමිටු රැස්වීම් වාර්තා සටහන්, අනුමැතිය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ. විගණන කමිටුව, විගණන විෂය පථය, අරමුණුසහගත බව එහි ඵලදායීත්වය සමාලෝචනය සහ නිගමනය කරයි. කමිටුව, ලංකා සීනි සමාගමේ අනාගත අපේක්ෂාවන් සමඟ එහි මෙහෙයුම් සමාලෝචනයට ලක් කරයි. කමිටුව විසින් මතුකරන ලද ගැටලුවලට ප්‍රතිචාර වශයෙන් කළමනාකාරීත්වය ක්‍රියාමාර්ග ගන්නා අතර පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සඵලත්වය ගැන ව්‍යාපාර ඒකක ප්‍රධානීන් / අධිකාරීවරුන් සමඟ සාකච්ඡා කර නිවැරදි ක්‍රියාමාර්ග නිර්දේශ කරනු ලැබේ.

ලංකා සීනි (පුද්) සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව, කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සමඟ කළමනාකාරීත්වය සහ විගණකයින් සමඟ සාකච්ඡා කළ අතර, විගණකවරුන් විසින් ඉස්මතු කොට පෙන්වූ අසතුටුදායක ක්ෂේත්‍ර නිවැරදි කිරීමට පියවර ගන්නා ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් හඳුනාගන්නා ලද ව්‍යාපාර ඒකක දෙකෙහි අභ්‍යන්තර පාලන දුබලතා, අත්වැරදි, ප්‍රධාන විධායක නිලධාරී සමඟ සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සමඟ සාකච්ඡා කොට වැදගත් ක්ෂේත්‍ර සුදුසු නිර්දේශ සමඟ ඉස්මතු කොට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලදී.

අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටුකරන ලද සේවය සහ සමාගමේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ළඟා කරගැනීම සඳහා ඔවුන් දරන උත්සහාය සම්බන්ධයෙන් විගණන කමිටුවේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමු. විගණන කමිටු සාමාජිකයින් දෙන ලද දායකත්වය සම්බන්ධයෙන් කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි. ඔවුන්ගේ මූල්‍ය කරුණු පිළිබඳව ඇති ප්‍රවීනත්වය සහ අදාළ පළපුරුද්ද සමාගමේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා මිලකළ නොහැකිය.

ටී.වී. වීරසේන
සභාපති
විගණන වාර්තාව



මිහිරි සඵලත්වය

කරා පැහැදිලි මගක්

අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපතිවරයා
නවීන් අධිකාරම මහතා



අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි
මොහොමඩ් ෂෙරිෆ්ඩීන් මොහොමඩ් ෆවුසර් මහතා



අධ්‍යක්ෂ
ටී. වී. වීරසේන මහතා




අධ්‍යක්ෂ
ආචාර්ය නිහාල් සමරප්පුලි මහතා



අධ්‍යක්ෂ
යූ. පී. පී. කවිකේෂව මහතා



අධ්‍යක්ෂ
ඒ. එච්. එම්. අලවි මහතා



අධ්‍යක්ෂ
අරුණ චතුරක කීර්තිරත්න මහතා

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ තොරතුරු

අපේ සභාපතිවරයා

නවීන් අධිකාරම් මහතා - විද්‍යාවේදී උපාධිය, සෙන්ට්‍රල් මිසොරි රාජ්‍ය විශ්ව විද්‍යාලය, කැන්සාස් නගරය, මිසෝරි, ඇමරිකා එක්සත් ජනපදය

අපගේ සභාපති නවීන් අධිකාරම මහතා සංයුක්ත, යහපාලනය, ව්‍යාපාරික ප්‍රතිව්‍යුහගතකරණය සහ ඇඩ්‍රීය රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිනිර්මාණය කිරීම සම්බන්ධයෙන් වසර 21 ට වැඩි පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ වූ වාර්තාවක් තබා ඇති නායකයෙකි. යහපත් දක්මක් ඇති ජයග්‍රාහක ව්‍යාපාරිකයෙකු තොරතුරු තාක්ෂණයේ සහ කළමණාකාරී විධායකයෙකු සමාගම් 500 ක් බිහිකිරීමට සමත්වූ, බහු ජාතික, බහු සංස්කෘතික, ශ්‍රී ලංකාවේ බහු වාර්ගික වාතාවරණය සහ ලෝකයේ පුරා ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, සිංගප්පූරුව, චීනය සහ නේපාලය වැනි රටවල දක්ෂ ව්‍යාපාරිකයෙකි. කලවම් සහ කළමණාකාරීත්වයන් වල බහු විස්තෘත සේවාවන් වල අධික පළපුරුද්දක් ඇත. CRM පද්ධති OCS පද්ධති (ඔන්ලයින් චාජින් පද්ධති) දුරකථන, බිල් කිරීමේ පද්ධතියේ ක්‍රියාත්මක කිරීමේ මූලික ඉල්ලීම් පෙර ගෙවුම් සහ පසුගෙවුම් පිළිබඳ මූලිකව ක්‍රියාකරන ලදි. වංචා කළමණාකාරී පද්ධතියේ NGN වේදිකා වල SDP, VAS සඳහා.

ඔහු පහත සඳහන් කමිටු සංවිධාන/සංවිධාන වල සේවය කරයි:

- ශ්‍රී ලංකාවේ නිරීත දිග විශ්ව විද්‍යාල කමිටුවේ සාමාජිකයෙකි.
- අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
- අධ්‍යක්ෂ - සීමාසහිත ශ්‍රී ලංකා තානායම්
- උපදේශන කමිටු සාමාජික- ව්‍යාපෘති කළමණාකාරී ආයතනය - ශ්‍රී ලංකා පාර්ශ්වය

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

මොහොමඩ් ෂෙරිෆ්ඩීන් මොහොමඩ් ෆවුසර් මහතා

මොහොමඩ් ෂෙරිෆ්ඩීන් මොහොමඩ් ෆවුසර් මහතා, ලංකා සීනි (පුද්) සමාගමේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර ඔහු එක්සත් රාජධානියේ මිඩ්ල්සෙක්ස් විශ්ව විද්‍යාලයේ උපාධිධාරියකු වන අතර එක්සත් රාජධානියේ (Wolverhampton) වොල්වර්හැම්ටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (MBM) උපාධිය ලබාගෙන ඇත. ඔහු වෘත්තියෙන් අලෙවිකරුවෙකි.

සුදුසුකම්

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MBM) වොල්වර්හැම්ටන් විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය - මිඩ්ල්සෙක්ස් විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ BTEC උසස් ජාතික ඩිප්ලෝමා (HND) එඩෙක්සෙල්, එක්සත් රාජධානිය
- අලෙවි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, ජාතික ව්‍යාපාරීත්ව කළමනාකරණ ආයතනය (NIBM)

වෘත්තීයමය පළපුරුද්ද

- අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී - ලංකා සීනි (පුද්) සමාගම
- ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - BCAS කැම්පස්
- උපදේශක - අලෙවි හා සන්නිවේදන, පැරඩයිස් ෆාම් (පුද්) සමාගම

අධ්‍යක්ෂ මණ්ඩලය

ටී.වී. විරසේන මහතා

වාණිජවේදී (විශේෂ) උපාධිය ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

වෘත්තීයමය පළපුරුද්ද

- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජික (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශය)
- උසස් ගණකාධිකාරී ඩිප්ලෝමාව - කාර්මික විද්‍යාලය
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)
- වරලත් ගණකාධිකාරී
- වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමාව (SLIDA)
- ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව - කාර්මික විද්‍යාලය

ආචාර්ය නිහාල් සමරප්පුලි මහතා
විද්‍යාවේදී උපාධිය (කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධිය (BSC) ශාස්ත්‍රපති උපාධිය (MSC) (කෘෂිකර්ම ව්‍යාපති), ආචාර්ය උපාධිය (Phd) (ආර්ථික විද්‍යාව)

ආචාර්ය නිහාල් සමරප්පුලි මහතා වසර 25 කට වැඩි කාලයක් ප්‍රධාන පෙලේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සේවා පලපුරුද්දක් ඇති වෘත්තීයෙන් ආර්ථික විද්‍යාඥයෙකි - ප්‍රතිපත්ති විශ්ලේෂකයෙකි. ආසියානු සංවර්ධන බැංකුව, (ADB) එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයක් වන කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ (IFAD) උපදේශකයකු වශයෙන් ද ඔහු සේවය කර ඇත. ඔහු විසින් වාර්තා 300 ක් ප්‍රතිපත්ති පත්‍රිකා විනය පිළිබඳ ගැඹුරු පර්යේෂණ පත්‍රිකා ලියා ප්‍රසිද්ධියට පත්කර ඇත. සංවර්ධන සැලසුම්කරණය, ප්‍රතිපත්ති විශ්ලේෂණය, ආයෝජන හා වෙළඳ ප්‍රවර්ධනය සහ අන්තර්ජාතික සම්මුති සාකච්ඡා පැවැත්වීම වැනි ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥ දැනුමක් ඔහු ලබා ඇත.

වෘත්තීය සුදුසුකම්

- සීමාසහිත ටෝකියෝ සිමෙන්ට් (ලංකා) සමාගම, කොළඹ 03. ශ්‍රී ලංකාව (අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ - 2015)
- ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (අධ්‍යක්ෂ ජනරාල් - ආයෝජන) 2013 - 2014
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (විධායක අධ්‍යක්ෂ - පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශනය) 2001 - 2014
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (අධ්‍යක්ෂ, පර්යේෂණ) 1998 - 2001
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය, ඩාර්ටන් ෆීල්ඩ්, අඟලවත්ත (කෘෂිකාර්මික අර්ථ ශාස්ත්‍රඥ) 1991 - 1998
- රබර් පර්යේෂණ මණ්ඩලය නිවිතිගල කැලේ මතුගම, ශ්‍රී ලංකා (පුහුණු කිරීමේ නිලධාරී) 1981 - 1991
- මහවැලි සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා (සහකාර පස් රසායනඥ) 1979 - 1981

යූ. පී. පී කවිකේෂව මහතා

යූ. පී. පී කවිකේෂව මහතා වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකු වන අතර ශ්‍රී ලංකා යුද හමුදාවේ විශ්‍රාමික බලලත් නිලධාරියෙකු වේ. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය හිමි කරගෙන ඇත. එමෙන්ම ඔහු සංස්ථාගත ඉංජිනේරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකාව (IESL) හී පූර්ණ සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා වෘත්තියවේදීන්ගේ සංගමයේ සාමාජිකයෙකුද වේ.

ඒ.එච්.එම්. අලවි මහතා

ඒ.එච්.එම්. අලවි මහතා කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය නියෝජනය කරමින් ලංකා සීනි සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

අරුණ චතුරක කීරතිරත්න මහතා

අරුණ චතුරක කීරතිරත්න මහතා තොරතුරු තාක්ෂණ වෘත්තියකු වන අතර සීමිත NHK හෝල්ඩින් (පුද්) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයාය. ඔහුට FCCISL ආයතනය විසින් "2012 වර්ෂයේ තරුණ ව්‍යවසායකයා" (ජාතික ජයග්‍රාහකයා සහ සබරගමුව පළාත) සම්මානය පිරිනැමීය.

වෘත්තීය සුදුසුකම්

- කළමනාකාර අධ්‍යක්ෂ, NHK හෝල්ඩිංස් (පුද්) සමාගම
- අධ්‍යක්ෂ, ලංකා සීනි (පුද්) සමාගම
- උපදේශක භූ දර්ශන (Landscaping), NSBM ග්‍රීන් යුනිවර්සිටි නගරය
- 'caaye' තරුණ ව්‍යවසායකයා සමුළුවට නියෝජිතයකු ලෙස ඉදිරිපත් වීම 2012, 2013 හා 2014

මිහිරි සවුලන්වයෙ

රස බෙදහැරීමේ කාලය



ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ ප්‍රධාන කාර්යාල සංවිධානයේ ව්‍යුහය



සභාපතිවරයා
නවීන් අධිකාරම මහතා



අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
මොහොමඩ් ෂෙරිෆ්ඩීන් මොහොමඩ් ෆවුසර් මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - පැල්වත්ත
යූ.පී.පී. කවිකේෂව මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - සෙවනගල
කේ.ඩබ්.වයි. ජයතිලක මහතා




මූල්‍ය සාමාන්‍යාධිකාරී
එන්.එච්. නවරත්න මහතා



ජ්‍යෙෂ්ඨ කළමණාකරු, ඉඩම් අත්පත් කර ගැනීම
එස්. සේනානායක මහතා

සංවිධාන ව්‍යුහය - පැල්වත්ත



පැල්වත්ත කළමණාකරණ කණ්ඩායම



ඉදිරි පෙළ වමේ සිට දකුණට

ලිලී එම්. හෙට්ටිආරච්චි මිය - විධායක- ආයතනික තොරතුරු , කේ.එල්.ජේ. ප්‍රනාන්දු, මහතා - වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්), ඩී.එම්.එස්. බණ්ඩාර මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කෘෂිකර්ම), යූ.පී.පී. කව්කේෂව- ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ආර්. එම්. ඩබ්ලියු. හේමකුමාර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලාව)/ නිෂ්පාදන කළමනාකරු (ස්කාගාරය), ආර්.එම්.ජේ. බණ්ඩාර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ස්කාගාරය), ඩී. එම්. ඒ. දිසානායක මහතා - මුල්‍ය ගණකාධිකාරී,


වමේ සිට දකුණට සිටගෙන (පළමු පේලිය)

සමන්ත වීරසේකෙර මහතා- කළමනාකරු (ගොල්ෆ් සහ විවේක ස්ථාන), ජේ.ඩී.පී ප්‍රඥාසීල මහතා- කළමනාකරු (ප්‍රවාහන, පැටවීම් සහ මිලදීගැනීම්), ජේ.ඒ.එන්. කුමාර මහතා - වැඩබලන කළමනාකරු ජනපදික වගාබිම්, එච්. එම්. අයි. ඒ. කේ. කටුගහ මහතා - නිෂ්පාදන කළමනාකරු (කර්මාන්තශාලාව), එච්.එම් . එස්. ටී. කුමාරසිරි මහතා - විදුලි ඉංජිනේරු, එස්.කේ. කෝට්ටගේ මහතා - කලමනාකරණ ගණකාධිකාරී, ආර්.එම්.එන්. කරුණාරත්න මහතා - සහකාර කළමනාකරු (වගාබිම් ආරක්ෂාව සහ ගිනි), ඩබ්ලියු.ඒ.කේ. පරක්‍රම මහතා- විමර්ශන සහායක, කේ. බී. විදුරසිංහ මහතා - ප්‍රාදේශීය පිටත වගා කළමනාකරු (වැල්ලවාය සහ වාන්දම), ටී. එම්. ඩී. තෙන්නකෝන්- ආරක්ෂක කළමනාකරු (ආවරණ)

වමේ සිට දකුණට සිටගෙන (දෙවන පේලිය)

එම්.බී. චන්දන මහතා - ප්‍රධාන ඉංජිනේරු (කෘෂි වැඩහල), අනුර විජේසිංහ මහතා - ගබඩා කළමනාකරු,, ආර්.ඒ.එම්. චන්දන මහතා - ශෂ්‍යවිද්‍යා, එල්.ඒ.සී. ප්‍රසන්න මහතා- ප්‍රාදේශීය පිටත වගා කළමනාකරු (පැල්වත්ත, බුත්තල සහ බඩල්කුඹුර), ආර්.එම්. සී. පුෂ්පකුමාර මහතා - කළමනාකරු (මිලදීගැනීම්), ඒ. මසාච්චි මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක, ඩබ්ලියු.එස් . කේ . රත්නායක මහතා - බිම් සංවර්ධන කළමනාකරු, කේ.එම්.කේ කිත්සිසි බණ්ඩාර මහතා - කළමනාකරු (තොරතුරු තාක්ෂණ), එම්.එම්.අතුල බණ්ඩාර මහතා - ඉංජිනේරු කළමනාකරු

සංවිධාන ව්‍යුහය - සෙවනගල



සෙවනගල කළමණාකරණ කණ්ඩායම



ඉදිරි පෙළ වමේ සිට දකුණට

එස්. ඒ. කමලදාස මහතා (වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මානව සම්පත්), ඩී.කේ.ඩබ්ලිව්.ද සිල්වා මහතා - නියෝජ්‍ය සාමානාධිකාරී(කර්මාන්තශාලා), කේ.ඒ.වෝල්ටර් මහතා (සාමාන්‍යාධිකාරී), කේ.ඩබ්ලිව්.වයි. ජයතිලක මහතා (ප්‍රධාන මෙහෙයුම් නිලධාරී), එච්.එම්.එස්.සමරවීර මහතා (නියෝජ්‍ය සාමානාධිකාරී- කෘෂිකර්ම, කින්ස්ලි පතිරණ මහතා (නියෝජ්‍ය සාමානාධිකාරී -මුල්‍ය)

දෙවන පෙළ වමේ සිට දකුණට

ඩබ්ලිව්.ඒ. ලයනල් වික්‍රමාරච්චි මහතා (ප්‍රවාහන කළමනාකරු), එස්. පිහිල්ලේගෙදර මහතා (කළමනාකරු -ප්‍රසම්පාදන සහ අළෙවි), එම්.උපුල් කුමාර මහතා - කළමනාකරු (කෘෂිකර්ම ව්‍යාප්තිය), අතුල සිරිදේව මහතා (කළමනාකරු -කෘෂිකර්ම ව්‍යාප්තිය), ඩී.සී.හෙට්ටිආරච්චි මහතා (ප්‍රධාන ඉංජිනේරු-බලශක්ති හා වැඩහල), එස්.වී.ඩී.එස්.ප්‍රියන්ත මහතා (ප්‍රධාන ඉංජිනේරු), එන්.ඒ.විමලරත්න මහතා (වැඩබලන කළමණාකරු-උපකරණ), පී.ඒ.කේ.නන්දදේව මහතා (කළමනාකරු -කෘෂිකර්ම ව්‍යාප්තිය), එස්.ඩබ්ලිව්.කොඩිතුවක්කු මහතා (කළමනාකරු -කෘෂිකර්ම ව්‍යාප්තිය)

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. පිඑල්ඒ/ඩී/එල්එස්සී/01/18/06 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 මැයි 13 දින

සභාපති
සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. විජේමරත්න
විගණකාධිපති

පිටපත් :- 01. ලේකම්- උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

02. ලේකම්- මුදල් අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිඵල්ඒ/ඩී/එල්එස්සී/01/18/06 මගෙ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 මැයි 13 දින

සභාපති

සීමාසහිත ලංකා සිනි පුද්ගලික සමාගම

සීමාසහිත ලංකා සිනි පුද්ගලික සමාගමේ2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමනඅවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ලංකා සිනි පුද්ගලික සමාගමේ ("සමාගම")2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 08 වන ඡේදය ප්‍රකාරව බැංකු අයිරාව මුදල් හා මුදල් සමාන දෑ ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කළ යුතු වුවත් සමාගම විසින් රු.665,484,944 ක බැංකු අයිරාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ කෙටි කාලීන බැංකු ණය යටතේ දක්වා තිබුණි.

(ආ) පැලවත්ත සීනි කර්මාන්ත ශාලාව හා සෙවනගල සීනි කර්මාන්ත ශාලාව ලංකා සීනි සමාගමට පවරා ගැනීමෙන් පසුව 2013 හා 2014 වර්ෂයන්හිදී වත්කම් ප්‍රත්‍යාගණනය කර තිබුනමුත් සෙවනගල කර්මාන්තශාලාවේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වලින් කොටසක් හැර අනෙකුත් වත්කම් වල ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි. ප්‍රත්‍යාගණන දෝෂ හා වත්කම්වල අයිතිය සම්බන්ධ ගැටළු ඊට හේතු වශයෙන් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි.

ඒඅනුව අදාළ දෝෂ නිවැරදි කරගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු නොකර පැල්වත්ත කර්මාන්තශාලාවේ පවරාගත් වත්කම්වල පොත් අගය රු.2,900,032,369 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබූ අතර සෙවනගල කර්මාන්තශාලාවේ පසුව මිලදිගත් වත්කම් හැර අනෙකුත් වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් එම වත්කම් හා ඊට අනුරූප ක්ෂය වටිනාකම් සාධාරණ ලෙස මූල්‍ය ප්‍රකාශ තුළින් හෙළිදරව් නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 57 ඡේදය ප්‍රකාරව සෙවනගල අංශය විසින් සමාලෝචිත වර්ෂයේ පාරිනෝෂිත වෙන්කිරීමට අදාළව ආයුගණක අලාභය රු.1,283,929 ක් අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ නොපෙන්වා ලාභයට එරෙහිව කපාහැර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් කර ඇති පිරිවැය රු.650,635,732 ක් වූ දේපළ පිරියත උපකරණ තවදුරටත් භාවිතයේ පැවතුණද එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සම්බන්ධිත පාර්ශව පහකින් ලැබිය යුතු එකතුව රු.19,498,293 ක් වසර 5 කට වැඩි කාලයක සිට අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 36 හි 59 ඡේදය ප්‍රකාරව ඊට අදාළව විය හැකි අලාභයන් වෙනුවෙන් වෙන්කිරීම් කර නොතිබුණි.

(ඊ) සෙවනගල අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදිගත් ස්ථාවර වත්කම් සඳහා වත්කම් භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය ගණනය නොකර මිලදි ගත් මුළු මාසයටම ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු.1,448,623 කින් වැඩියෙන් ගිණුම්ගත වීම මත සමාලෝචිත වර්ෂයේ ලාභය සහ ස්ථාවර වත්කම්වල ශුද්ධ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) පැල්වත්ත හා සෙවනගල යන අංශවල 2018 වර්ෂය තුළ මුදලින් ලද ස්ථාවර තැන්පතු පොලී ආදායම් පිළිවෙලින් රු. 76,324,750 ක් හා රු. 109,531,116 ක් වුවත්, එය පිළිවෙලින්රු. 89,303,735 ක් සහ රු. 124,848,195 ක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීම හා එම වෙනස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ගැලපීම් නිසා ආයෝජන ක්‍රියාකාරකම් පිළිවෙලින් රු. 12,978,985 ක් හා රු. 15,317,079 ක් වැඩියෙන් ද මෙහෙයුම් ක්‍රියාකාරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.

(ඌ) සමාගම විසින් තක්සේරු වර්ෂය තුළ උපයා තිබූ එකතු කළ අගය මත බද්දට යටත් රු. 43,889,267 ක් වූ අනෙකුත් සේවා ආදායම් සහ රු. 25,800,321 ක් වූ විවිධ ආදායම් සඳහා රු. 10,453,438 ක් නිමවුම් මත බදු ගණනය කර නොතිබුණි.

(එ) කර්මාන්තශාලා පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධන දීමනා ගණනය කිරීමේදී 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව යොදාගත යුතු ප්‍රාග්ධන දීමනා අනුපාතය සියයට 20 ක් වුවත් භූමාගම විසින් සියයට $33^{1}/_{3}$ක් යොදා ගැනීම හේතුවෙන් සහ 2018/2019 තක්සේරු වර්ෂයට අදාළව නිකුත් කර තිබූ 2018 අප්‍රේල් 01 දිනැති අංක 2064/53 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සලකා බලන තක්සේරු වර්ෂයට පෙර වර්ෂ 6 ක ඉදිරියට ගෙන එන ලදරු. 642,147,147 ක අලාභ, බදු සඳහා ලාභය ගණනය කිරීමේදී අඩු කිරීමට හැකි වුවත් සමාගම විසින් ව්‍යවස්ථාපිත ආදායමෙන් සියයට 35 ක් පමණක් අඩු කිරීම හේතුවෙන් තක්සේරු වර්ෂයේ ආදායම් බදු වියදම රු. 70,746,831 කින් අධි වෙන්කිරීමක් කර තිබුණි.

(ඒ) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු පැල්වත්ත අංශයේ රු. 86,968,862 ක් හා සෙවනගල අංශයේ රු. 209,621,311 ක්ද, ගොවි ණය ශේෂ සෙවනගල අංශයේ රු. 219,190,134 ක්ද වශයෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණද, ණයගැනි උපලේඛනයන්හි එම වටිනාකම් පිළිවෙලින් රු. 75,471,697 ක්, රු. 221,118,476 ක් හා රු.216,891,926 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් පිළිවෙලින් රු. 11,497,165 ක්, රු. 11,497,165 ක් හා රු. 2,298,208 ක් වශයෙන් වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) සෙවනගල අංශයේ කල්බදු වාහන 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව කල්බදු ශේෂ වටිනාකම් එකතුව රු. 15,621,410 ක් වුවද, ශේෂ සනාථන ලිපි අනුව වටිනාකම් රු. 17,329,490 ක් වීමෙන් රු. 1,708,080 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම රු. 6,312,743,943 ක් වුවද, ජාතිය ගොඩනැඟීමේ බදු වාර්තා හා ආර්ථික සේවා බදු ගාස්තු වාර්තා පිළියෙල කිරීම සඳහා පදනම් කර ගෙන තිබූ ආදායම පිළිවෙලින් රු.6,110,708,431 ක් හා රු.6,259,864,604 ක් වූයෙන් පිළිවෙලින් රු.201,935,512 ක් හා රු. 52,779,339 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ක) පැල්වත්ත අංශය විසින් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඇනවුම් කළ රු. 5,924,850 ක් වටිනා කර්මාන්තශාලා අමතර කොටස් මාර්ගස්ථ තොග ලෙස ගිණුම්ගත කර තිබූ නමුත් එසේ ඇනවුම් කරන ලද කර්මාන්තශාලා අමතර කොටස් මොනවාද යන්න සහ මේ දක්වා එම තොග නොලැබීමට හේතුව නහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. විගණනයේදී මෙය මතභේදාත්මක ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය

කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයටයොමුව	විස්තරය
(අ)	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26 (1)වගන්තිය හා 2009 අංක 09 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනතේ 04 (i)වගන්තිය	සෑම්මසකමඅවසානදිනටගණනයකරනබදුමුදල්ඊළඟමාසයේ 20 වැනිදිනහෝඑදිනටපෙරදේශීයආදායම්දෙපාර්තමේන්තුවටදැනුම්දීම සඳහා එකතු කළ යුතු වුවත් 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.35,054,595 ක් හා ජාතිය ගොඩනැඟීමේ බදු වටිනාකම රු.93,091,778 ක් ගෙවීමට ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතෙහි 6 වන වගන්තිය	සෑම කාර්තුවකම අවසාන දිනට ගණනය කරනු ලබන ආර්ථික සේවා ගාස්තු ඊළඟ කාර්තුවේ පළමු මාසයේ 20 වැනි දිනට හෝ එදිනට පෙර ගෙවිය යුතු වුවත් සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ මාස 02 කට අදාළ එකතුව රු.6,000,000 ක බදු පිළිවෙලින් දින 181 ක් හා දින 271 ක් ප්‍රමාදකර ප්‍රේෂණය කර තිබුණි.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පිරිඩී/12 දරන රාජ්‍යව්‍යාපාර දෙපාර්තමේන්තු වක්‍රලේඛයේ6.5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 17 ක් ප්‍රමාද කර 2020 ජූලි 31 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2019 ඔක්තෝම්බර් 31 දින දී විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. **වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) පැල්වත්ත අංශය රජයට පවරා ගන්නා අවස්ථාවේදී පැවති යල්පැනගිය තොග සඳහා වූ රු. 9,251,437 ක වෙන්කිරීම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මූල්‍ය ප්‍රකාශවලින් ඉදිරියට ගෙනෙවිත් තිබුණි.

(ආ) පැල්වත්ත අංශය රජයට පවරාගැනීමට පෙර සිට පැවති රු. 37,410,797 ක ව්‍යාපෘතිය හා රජයට පවරා ගැනීමෙන් පසු ආරම්භ කළ නවත් රු.53,701,955 ක් වැය කළ ව්‍යාපෘති 5 ක් අවසන්වීමකින් තොරව නවතා දමා තිබූ නමුත් ඒ කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමුවී නොතිබූ අතර ඒවා කෙරීගෙන යන වැඩ වශයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නිබුණි.

	වටිනාකම රු.
ඉඩම් සංවර්ධන කටයුතු (Land Development) - පැල්වත්ත	19,794,226
ගොඩනැගිල (Building) - පැල්වත්ත	4,259,866
කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය (Compost Plant)	571,362
බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය(Power Generation Project)	2,008,690
